# චිත්ත (සිත)



ජීවී සහ අජීවී දේ පිළිබඳ සලකන විට එහි වෙනස අපි කෙසේ දකිමුද? බෝනික්කා සහ ළමයා අතර වෙනස බලන්න. රූපයෙන් පෙනෙන ලෙසට සමාන වුවද ක්‍රියාවෙන් දෙදෙනා අතර ලොකු වෙනසක් ඇත. මක්නිසාදයත් ළමයාට සිතක් ඇති නිසාවෙනි.

| ළමයා | බෝනික්කා |
|---|---|
| ඇස් ඇත - රූප දකියි | ඇස් ඇත - රූප නොපෙනෙයි |
| කන් ඇත - ශබ්ද අසයි | කන් ඇත - ශබ්ද නො ඇසෙයි |
| නහසය ඇත - ආඝ්‍රානය කරයි | නහසය ඇත - ආඝ්‍රානය නොකරයි |
| ................................................................... | ............................................................................................. |

මේඅනුව තලකා බලනවිට ළමයාට පෙනෙන්න ඇසෙන්න..........හැකිවීමටත් බෝනික්කාට නොහැකිවීමටත් හේතුව නිවැරදි ඉන්ද්‍රිය සහ සිතක් ද තිබීමය. ආධ්‍යාත්මික ඉන්ද්‍රිය තුලින් ගන්නා අරමුණ දැනගන්නේද සිතන්නේද සිතමය. ඒ අනුව අරමුණ දැනගන්නා නියෝජිතයාද සිතන උපකරණයද සිතීම නැමති ක්‍රියාව කරන්නාද සිතමය.